අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/17/03/44

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020.05. 18

**චක්‍රලේඛ අංකය : 08/2020**

**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,**
**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**
**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,**
**සියලුම විදුහල්පතිවරුන්,**

**<u>සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලිය</u>**

**තාක්ෂණය සීඝ්‍රයෙන් දියුණු වන අවධියක, ලෝකය රොබෝ තාක්ෂණ හා නව නිපැයුම් ප්‍රවේශ වෙත නැඹුරු වෙමින් පවතින බව ප්‍රකට කරුණකි. මෙම ක්ෂේත්‍ර හා සබැඳි දැනුම, ආකල්ප, කුසලතා හා ප්‍රායෝගික ශිල්ප ක්‍රම පුහුණු වෙමින් අනාගත වැඩ ලෝකයෙහි අභියෝගවලට මුහුණ දීම සඳහා සිසු දරු පරපුර සූදානම් කරවීමටත්, ඔවුන්ගේ නව නිර්මාණාත්මක කෞශල්‍ය ඔප් නැංවීමටත්, අධ්‍යාපන අමාත්‍යාංශය සමස්ත ලංකා පාසල් රොබෝ තරඟය හා නව නිපැයුම් තරඟය වාර්ෂිකව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.**

**මෙම චක්‍රලේඛය 2019.05.21 දිනැතිව නිකුත් කළ අංක 28/2019 චක්‍රලේඛයේ විධිවිධාන අභිබවා ඉදිරියට ක්‍රියාත්මක වේ.**

**01. අරමුණු :-**

1. **පාසල් දූ දරුවන්ගේ සැඟවුණු දක්ෂතා කලඑළි දැක්වීම, දිරිගැන්වීම හා ඇගයීම**
2. **අනාගත වැඩලෝකයේ දිශානතිය පිළිබඳ අවබෝධය යාවත්කාලීන කරවීම, නව්‍යතාවයෙන් යුතු ව සිතීමට දරුවන් යොමු කරවීම හා එමඟින් දරුවන්ගේ නවෝත්පාදන හැකියාව වැඩි දියුණු කිරීම**
3. **ලෝකයේ ශීඝ්‍රයෙන් දියුණු වන තාක්ෂණික ප්‍රවණතා වෙත ශ්‍රී ලාංකේය අධ්‍යාපන ප්‍රවේශය තහවුරු කිරීම**
4. **රොබෝ තාක්ෂණ අධ්‍යාපනය කෙරෙහි රජයේ මැදිහත්වීම ශක්තිමත් කර පාසල් දූ දරුවන්ගේ හැකියාවන් දිවයින පුරා ප්‍රචලිත කරවීම**
5. **අනාගත වැඩ ලෝකය හා උරෙනුර ගැටීමට හැකි වන පරිදි ශ්‍රම වෙළඳ පොළට අවශ්‍ය රොබෝ ශිල්පීය කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීම මඟින් ස්වයංක්‍රීයකරණය පිළිබඳ ව්‍යවසායකත්ව සංකල්ප ස්ථාපනය කිරීම**

වාර්ෂිකව පවත්වනු ලබන පාසල් තරඟයේ දී පහත සඳහන් කරුණු අවධාරණය කෙරේ.

**02.** තරඟය සඳහා ආවරණය වන විෂය පථය :-

මෙම තරඟය ප්‍රධාන තේමා දෙකකින් යුතුව පැවැත්වේ.

I. තේමාව 1 - රොබෝ තාක්ෂණ ආශ්‍රිත තරඟාවලිය

II. තේමාව 2 - නව නිර්මාණ තරඟාවලිය

තරඟාවලිය සඳහා මෙම තේමා දෙක යටතේ පහත ශීර්ෂ අංකවලින් දැක්වෙන පරිදි තාක්ෂණ භාවිත එක් එක් ක්ෂේත්‍ර අනුව නිර්මාණ ඉදිරිපත් කළ හැකිය. එක් නිර්මාණයක් එක් තේමාවක් යටතේ පමණක් ජාතික තරගයට ඉදිරිපත් කළයුතු වේ.

| ශීර්ෂ අංකය | ක්ෂේත්‍රය |
|---|---|
| 01. | නිෂ්පාදන කර්මාන්ත හා පරිසර අධ්‍යයන ක්ෂේත්‍රය<br>➢ කෘෂිකාර්මික, ධීවර, අනෙකුත් නිෂ්පාදන හා පරිසර කටයුතු ක්ෂේත්‍රවල වැඩ පහසු කරගත හැකි හෝ ක්‍රියාදාම ස්වයංක්‍රීයකරණය පාදක කරගත් රොබෝ හා වෙනත් නිර්මාණ |
| 02. | අධ්‍යාපන ක්ෂේත්‍රය<br>➢ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරගත හැකි රොබෝ නිර්මාණ හෝ වෙනත් නිර්මාණ<br>➢ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු කර ගැනීම සඳහා භාවිතා කළ හැකි රොබෝ හෝ වෙනත් නිර්මාණ |
| 03. | ඉංජිනේරු තාක්ෂණ හා නිෂ්පාදන ක්ෂේත්‍රය<br>➢ ක්‍රියාදාම ස්වයංක්‍රීයකරණයට අදාළ රොබෝ හෝ වෙනත් නිර්මාණ<br>➢ නිෂ්පාදන තාක්ෂණික පිරිවැය අවම කිරීමේ රොබෝ යන්ත්‍ර හෝ වෙනත් නිර්මාණ |
| 04. | විනෝදාස්වාද ක්ෂේත්‍රය<br>➢ විනෝද / ක්‍රීඩා කටයුතු සඳහා යොදාගත හැකි රොබෝ යන්ත්‍ර හෝ වෙනත් නිර්මාණ |
| 05. | සෞඛ්‍ය හා වෛද්‍ය විද්‍යාත්මක ක්ෂේත්‍රය<br>➢ සෞඛ්‍ය සංරක්ෂණය හෝ වෛද්‍ය කටයුතු සඳහා භාවිතා කළ හැකි රොබෝ නිර්මාණ හෝ වෙනත් නිර්මාණ |

**03.** තරඟ මට්ටම :-

I. ශ්‍රී ලංකාවේ පළාත් 9 ආවරණය වන පරිදි ජාතික හා පළාත් සභා පාසල්වල 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා අධ්‍යයන කටයුතුවල නිරත වන වයස අවුරුදු 18 ට අඩු පාසල් සිසුන්ට මේ සඳහා සහභාගි විය හැකිය.

II. සියලුම පාසල්වල (රජයේ, උපකෘත පාසල්) හා පිරිවෙන් සිසු සිසුවියන්ට මෙම තරගය සඳහා

ව්‍යවහාර තම පාසලේ විදුහල්පතිගේ/ පරිවේනාධිපතිගේ නිර්දේශය මත පළාත් තරඟ සඳහා ඉදිරිපත් කෙරේ.

III. මෙම තරඟය සඳහා ඉදිරිපත් කරන සෑම නිර්මාණයක්ම තනි ශිෂ්‍යයෙකු මගින් කළයුතු වන අතර කණ්ඩායම් සඳහා සහභාගි විය නොහැක.

IV. පළාත් මට්ටමින් ඉහත සඳහන් කරන ලද තේමා ඔස්සේ ක්ෂේත්‍ර අනුව ප්‍රථම, දෙවන හා තෙවන අවස්ථා ලබා ගන්නා නිර්මාණ ද අවසන් මහා තරඟය හා සමගාමීව පැවැත්වෙන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කෙරේ.

V. පළාත් තරඟය ද එක් එක් තේමාව ඔස්සේ එක් එක් ක්ෂේත්‍රවලට අනුකූලව පැවැත්විය යුතුය.

VI. පළාත් තරඟයෙන් ජයග්‍රහණය කරන නිර්මාණ අතරින් එක් එක් තේමාව ඔස්සේ එක් එක් ශිල්ප ක්ෂේත්‍රයන්ට අදාලව අවසාන මහා තරඟයෙන් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන තෝරා ගනු ලබන අතර ජයග්‍රාහකයන්ට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සහතිකපත්, ජයසංකේත හා ත්‍යාගයන් පිරිනමනු ලබන අතර හිමිවන මුදල් ප්‍රමාණ පහත පරිදි වේ. (රොබෝ තාක්ෂණ තරඟාවලිය හා නව නිපැයුම් තරඟාවලිය යටතේ එක් එක් ක්ෂේත්‍ර සඳහා පහත දැක්වෙන පරිදි මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.)

| | | |
|---|---|---|
| ප්‍රථම ස්ථානය | - රු. 25,000.00 | - 01 |
| දෙවන ස්ථානය | - රු. 15,000.00 | - 01 |
| තෙවන ස්ථානය | - රු. 10,000.00 | - 01 |
| කුසලතා | - රු. 5,000.00 | - 04 වන ස්ථානයේ සිට 10 වන ස්ථානය දක්වා |

VII. එක් එක් ක්ෂේත්‍රයෙන් ප්‍රථම ස්ථානය ලබා ගන්නා පාසල්වලට එම පාසලෙහි තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා රු.25,000.00 මූලාධාර පිරිනමනු ලැබේ.

**04.** කාල රාමුව :-

| | | |
|---|---|---|
| පාසල් මට්ටමේ තරඟ | - | ජූනි 30ට පෙර |
| පළාත් තරඟය | - | ජූලි 31ට පෙර |
| ජාතික තරඟය | - | සැප්තැම්බර් 30ට පෙර |

**05.** සංවිධානය හා විනිශ්චය කටයුතු :-

පළාත් තරඟය

පළාත් මට්ටමේ තරඟය පළාතේ තාක්ෂණ විෂයයන් සම්බන්ධීකරණය කරන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සංවිධානය කළ යුතු වේ. පළාත් මගින් සංවිධානය කරනු ලබන තරඟාවලියේ විනිශ්චය මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය යුතුය.

- විශ්ව විද්‍යාලයක රොබෝ තාක්ෂණය/ ඉලෙක්ට්‍රොනික හා විදුලි ඉංජිනේරු විද්‍යාව/ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව/ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව/ කෘත්‍රිම බුද්ධිය හෝ අදාල ක්ෂේත්‍රයකින් ප්‍රාමාණික දැනුමක් සහිත කථිකාචාර්යවරයෙකු හෝ මෙම අංශවලින් වරලත් ඉංජිනේරුවරයෙකු
- අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් නම් කළ නිලධාරියෙකු
- පළාතේ තාක්ෂණ විෂය / ඉංජිනේරු තාක්ෂණවේදය විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ /

- වෙනත් පළාතක් නියෝජනය කරන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය සහිත ගුරුභවතෙකු
- පළාත් මට්ටමෙන් තරඟයේ අවසන් තීරක ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කටයුතු කරනු ඇත.

**06.** ජාතික තරඟය :-

අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් ජාතික තරඟය සංවිධානය කරනු ඇත.
ජාතික තරඟයේ විනිශ්චය මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය යුතුය.

- විශ්ව විද්‍යාලයක රොබෝ තාක්ෂණය/ ඉලෙක්ට්‍රොනික් හා විදුලි ඉංජිනේරු විද්‍යාව/ ඉලෙක්ට්‍රානික් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව/ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව කෘත්‍රිම බුද්ධිය හෝ අදාළ ක්ෂේත්‍රයකින් ප්‍රාමාණික දැනුමක් සහිත කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හෝ මෙම අංශවලින් වරලත් ඉංජිනේරුවරුන් දෙදෙනෙක්
- අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔහු විසින් නම් කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු

**07.** තීරක මණ්ඩලය :-

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන නියෝජිතයන් තිදෙනෙකු තීරක මණ්ඩලය ලෙස කටයුතු කරනු ලබන අතර එම තරග විනිශ්චය කටයුතු සම්බන්ධයෙන් අවසාන තීරණය තීරක මණ්ඩලය සතු වේ.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ඕනෑම ගැටළුවක් සම්බන්ධව අවසාන තීරණය අධ්‍යාපන ලේකම් සතුවන අතර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තන අතර අසංගතතාවක දී සිංහල පිටපත් බලාත්මක වේ.

මෙම උපදෙස් අනුව ඔබ විද්‍යාලයේ, පළාතේ සිසු දරුවන් අතර රොබෝ තාක්ෂණය ප්‍රචලිත කිරීමේ කටයුතු සිදු කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි. ශ්‍රී ලාංකික සිසු පරපුරේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කෙරෙන මෙම කාර්යය සඳහා ඔබගෙන් ලැබෙන සක්‍රීය දායකත්වය අගය කරමි.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය